# සිංහල දෙමළ ජනවාර්ගික සම්බන්ධතාවය බිඳවැටීම සහ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය පැනනැගීම

ඊ. එම්. සමන්ත ඒකනායක

## ප්‍රවේශය

ශ්‍රී ලංකාව පිළිබඳ ලියන ලද ඓතිහාසික වංශ කථාවල සිංහලදෙමළ සම්බන්ධතාවය පිළිබඳ බොහෝ සංසිද්ධීන් අන්තර්ගතව ඇත. ඉතිහාසයේ නිරූපණය වන සිංහලදෙමළ සම්බන්ධතාවය විමසා බැලීමේ දී දුටුගැමුණු රාජ්‍ය සමයෙහි සිදු වූ එළාර සහ දුටුගැමුණු ද්වන්ධ යුද්ධය සුවිශේෂී අන්දමින් සිංහලදෙමළ ලොකු කුඩා සැමගේ විඥානයට (Conscience) එක්වන සංසිද්ධියකි. එළාර රජු ද්‍රවිඩයෙකු මෙන්ම, ඔහු සිංහල බෞද්ධ විරෝධියෙකු බවත් මහාවංශය පෙන්වා දී ඇත. එපමණක් නොව එළාර දුටුගැමුණු යුද්ධය පෙන්වා දී ඇත්තේ හින්දු දෙමළ ජාතිකයෙකු උදුරාගත් දිවයිනේ නැවත වරක් සිංහල බෞද්ධ ආධිපත්‍යයක් තහවුරු කිරීම සඳහා කරනු ලබන යුද්ධයක් ලෙසය (සිරිවීර 1979:59). කෙසේ වෙතත් ලංකා ඉතිහාසයේ එක් දීර්ඝතම යුගයක් ගෙවී ඇත්තේ දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් හා ස්වදේශිකයන් අතර කෙරෙන යුද්ධවලිනි. විටෙක ආක්‍රමණිකයා ජය ගත් අතර විටෙක ආක්‍රමණිකයා පළවා හැර ස්වදේශිකයන් ජය ලැබූහ. මෙම සෑම ආක්‍රමණයක්ම දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් විසින් කර ඇති බවටත්, ඔවුන් අවශ්‍යයෙන් ම බෞද්ධ විරෝධී බවටත් හා වියළි කලාපීය සිංහල ශිෂ්ටාචාර විනාශ කළ බවටත් පුළුල් විශ්වාසයක් සිංහල ජනතාව අතර පවතියි. එහෙත් ලංකාව ආක්‍රමණය කළ දකුණු ඉන්දියානුවන් සියලු දෙනාම ද්‍රවිඩයෝ නොවූහ (අයිවන් 1983:04). ඓතිහාසික යුගයේ වාර්ගික සම්බන්ධතාවය විමර්ශනය කිරීමේ දි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාක්ෂි තවමත් විද්‍යාර්ථයින්ගේ මතභේදයට තුඩුදෙන්නකි. එහෙත් නිදහන් ශ්‍රී ලාංකේය සමාජයේ විනිවිධ පෙනෙන මෑත ඉතිහාස සාක්ෂි මගින් සිංහල දමිළ වාර්ගික සම්බන්ධතාවය බිඳවැටී වසර තිහක් පමණ කාලයක් පැවති ජනවාර්ගික යුද්ධය සඳහා තුඩුදුන් හේතුසාධක පිළිබඳ ද්විතික මූලාශ්‍ර ඇසුරින් සමාජවිද්‍යාත්මක විග්‍රහ කිරීම මෙහි මූලික අරමුණයි-

වර්ෂ 1948 පෙබරවාරි 04 වන දින ලැබූ අධිරාජ්‍යවාදි නිදහසින් පසුව ශ්‍රී ලංකාව තුළ වර්ගවාදී ප්‍රශ්නය වර්ධනය වීම කෙරෙහි විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති බලපෑවේය. ඇතැම් විචාරකයින් පෙන්වා දෙන්නේ සුළු වාර්ගික සමූහ අපහරණයට ලක්වන රාජ්‍ය ක්‍රියාකාරිත්වයක් නිර්මාණය වූයේ නිදහස ලබා ගැනීම සඳහා ශක්තිමත් වූ ජාතික ව්‍යාපාරයක් ගොඩ නොනැගීම හේතුවෙනි (අයිවන් 1999:810). නිදහස ලබන විට අප රට ඉදිරියේ පමණක් නොව ඉන්දියාව ඉදිරියේත් වර්ගවාදි ගැටලු උද්ගතව තිබුණි. එහෙත් ඔවුන් ශක්තිමත් වූ ජාතික ව්‍යාපාරය තුළින් ජාතික අනන්‍යතාවයක් ගොඩ නැංවීමට සමත් වූයේය. එහෙත් මෙම තර්කය සමහරු එකහෙලා පිළිනොගනිති. ඔවුන් පෙන්වා දෙන්නේ ඉන්දියාවේ, ලංකාව තුළ මෙන් ප්‍රධාන ජනවර්ගයක් හඳුනාගත නොහැකි අතර රාජ්‍ය ස්ථාපිත කරවීමේ දී මෙම ජනවාර්ගික සමූහයන්ගේ සහයෝගීතාව අවශ්‍යම වූ බවයි. එබැවින් ජනවාර්ගික භේදයකින් තොරව සමාන අයිතිවාසිකම්, සමාන සම්පත් ව්‍යාප්තිය සිදු වී ඇති බවත් දක්වාලයි- එහෙත් ලංකා සමාජය තුළ සිංහල ජනවර්ගය ප්‍රධාන වීම හේතුවෙන් රාජ්‍ය පවත්වා ගැනීමට ප්‍රධාන ජනවර්ගය සමත්වන බැවින් සුළු වාර්ගික අවශ්‍යතා දෙවෙනි කොට සැලකීම, වාර්ගික ගැටලුව ඇතිවීමට හේතුසාධක වූ බැව් පෙන්වා දෙයි- මෙම කුමන මතවාදයෙන් උවද අවසන දක්වෙන්නේ ලංකාවේ නිදහසින් පසුව ස්වදේශීය පාලනය තුළ සුළු වාර්ගික සමූහ අපහරණයට ලක්වන ප්‍රතිපත්ති නිර්මාණය වීම

හේතුවෙන් සිංහල දෙමළ වාර්ගික සබඳතාවය බිඳවැටී 1980 දශකය තුළ වාර්ගික ගැටුමක් උද්ගත වූ බවයි-

## ජනවාර්ගික බෙදුම්වාදය පැනනැගීමට බලපෑ ආසන්න හේතු

ජාතික නිදහස අරභයා ඇති වූ "ජාතික ව්‍යාපාරය" ආරම්භයේ දී සිංහල සහ දෙමළ ජනතාවගෙන් සමන්විත විය. මෙම ජාතික ව්‍යාපාරයේ පළමු වන සභාපති ධූරයට පත් වූයේ දෙමළ පුද්ගලයෙකි. මෙලෙස ජාතික ව්‍යාපාරය සමගියෙන් ආරම්භ වූ අතර 1923 දී සභාපතිත්වයට පත් වූ එච්. ජේ. සී. පෙරේරා එහි අරමුණ විග්‍රහකරන ලද්දේ පහත අයුරිනි.

> "මෙම සංගමයේ අවසාන අරමුණ බ්‍රිතාන්‍ය ධජය යටතේ අභ්‍යන්තර පාලනය ලබා ගැනීමයි. මතක තබා ගන්න අපි එයට නිදහස කියන්නේ නැත- අපි එය කවදාවත් නොයිල්ලුවෙමු එය ඉල්ලීමට තරම් අපි මෝඩයෝ නොවෙමු"

මෙයින් පැහැදිලි වන්නේ ලංකාව තුළ සටන්කාමී ජාතික ව්‍යාපාරයක් ක්‍රියාත්මක නොවුන බවයි- විශේෂයෙන් මුලින් සඳහන් කළ පරිදි වර්ධනය වෙමින් පැවති ජාතික ව්‍යාපාරය ද ආණ්ඩුකාර මැනින්ගේ උපක්‍රම තුළ බිඳ වැටුණි. මේ තත්වය තුළ ශ්‍රී ලංකාව නිදහස ලබා ගත්තේ ප්‍රබල ජාතික වැයමක ප්‍රතිඵලයක් ලෙස නොවන බව පැහැදිලි වේ (ආරියරත්න 1988: 162)- නමුත් ඉන්දියාව නිදහස ලැබුවේ ලංකාව මෙන් මහරැජිණියට පෙත්සම් යැවීම්, යටත්වීම් ආදි ක්‍රියා මාර්ගයකින් නොව, ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ දැවැන්ත විරෝධතා අරගලයන් තුළිනි (ප්‍රනාන්දු 2000 :07). එවැනි සරල ක්‍රියා මාර්ගයක් තුළ පොදු ජාතික දෘෂ්ටියකින් එකට බැඳුනු ශක්තිමත් ජාතික සංගමයක් ඇති නොවන්නා සේම ශක්තිමත් දේශපාලන නායකත්වයක් ද ඇති නොවෙයි. එම නායකයින් වර්ග භේදය, ආගම්, භාෂා, කුල තුළ එයට එරෙහි නොවූ පිරිසක් ලෙස සියලු ජන කාණ්ඩවල පොදු එකඟත්වයක් ඇති කිරීමට සමත් නොවෙයි (අයිවන් 1999 :19 21). ලංකාවේ ද ප්‍රබල සටනකින් ලබා ගත් ජාතික නිදහසක් නැති නිසාම 1948 න් පසු ලංකා සමාජයේ ස්වදේශ රාජ්‍ය පාලනය තුළ වර්ගවාදී ගැටුම් ඇති වීමට විවිධ සාධක බලපා ඇති බවට යථෝක්ථ තර්කය ඔස්සේ පැහැදිලි කරගත හැකිය.

## වියලි කලාපීය ජනපද ව්‍යාපාරය

1930 දශකයේ පටන් ශ්‍රී ලංකා ආණ්ඩුව ආරම්භකරන ලද ගොවිජනපද ව්‍යාපාර සඳහා අරමුණු ගණනාවක් දැකිය හැකිය. ඒ අතර කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීම, තෙත් කලාපීය ජනගහන ගැටලුවට පිළියම් සැපයීම හා සමාජ ආර්ථික සාධාරණත්වයක් ඉටුවන ගැමි සමාජයක් ගොඩ නැංවීම ආදිය ජනාවාසකරණයේ මූලික අරමුණු විය (නානායක්කාර 1987:87105). මෙම අරමුණු මුදුන්පත් කරගැනීමේ සාර්ථක අසාර්ථකතාව විමර්ශනය කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සම්බන්ධතාවය කෙරෙහි මෙමගින් ඍණාත්මක බලපෑමක් සිදු වී ඇති බව තොරතුරු විමර්ශනයන් තුළින් පැහැදිලි වේ. යථෝක්ත අරමුණු පෙරටු කොට ජනපදකරණ ව්‍යාපාර (වියලි කලාපීය) ආරම්භ කළ ද එම තත්වය ද්‍රවිඩ දේශපාලාඥයන් දුටුවේ තම සාම්ප්‍රදායික දෙමළ නිජභූමිය (Tamil Homeland) උදුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ගයක් ලෙසිනි.

1949 ගල්ඔය ජනපද ව්‍යාපාරය තුළ මුළුමනින්ම සිංහල ජනතාව පදිංචි කිරීම දේශපාලන උපක්‍රමයක් ලෙස ද්‍රවිඩ ජනයා හා මුස්ලිම් ජනයා කල්පනා කළහ. කෙසේ නමුත් ජනපදකරණ ව්‍යාපාරයට දමිළ ජනතාව විරුද්ධවීමට හේතු කිහිපයක් විය. එනම් වැඩි ප්‍රතිශතයක් සිංහල පවුල් පදිංචි කිරීම පදනම්කොටගෙන ජනවාර්ගික සංයුතිය වෙනස්වීමෙන් දෙමළ ජනතාවට ඔවුන්ගේ නිජභූමිය අහිමිවේ යයි යන බිය එක් හේතුවකි. එම විරුද්ධත්ව ඔවුන් 1946 අගෝස්තු 19 ෆෙඩරල් පක්ෂ සමුළුවේ දී ප්‍රකාශ කළේය (Peebles 1990:54). 1949 දී ගොවිජනපද ව්‍යාපාරයේ ආරම්භක අවස්ථාවේ සිටම එයට දමිළ ෆෙඩරල් පක්ෂය විරුද්ධ විය (Wilson 1988:48).

1944 වර්ෂයේ දී දෙමළ කොන්ග්‍රස් පක්ෂය විසින් උතුරු නැගෙනහිර පළාත්හි පිහිටුවන ලද ගොවිජනපද ව්‍යාපාරවලට විරුද්ධව සොල්බරි කොමිසම හමුවේ පැමිණිලි කරන ලදී. සමස්තයක් ලෙස දෙමළ දේශපාලකයින් ජනපදකරණය සම්බන්ධයෙන් කිසිම සහයෝගයක් නොදක් වූ අතර ඔවුන්ගේ අදහස වුයේ රජයේ විශාල මුදලක් වැයකරමින් ඔවුන්ගේ සාම්ප්‍රදායික නිජභූමිය අහිමි කිරීමට කටයුතු කරන බවයි. කෙසේ වෙතත් වියළි කලාපීය ගොවිජනපද ව්‍යාපාර හේතුවෙන් වාර්ගික සංයුතියෙහි පැහැදිලි වෙනසක් සිදු වී ඇති බැව් ජන සංගණන වාර්තා විමසුමට ලක්කිරීමේ දී තේරුම්ගත හැකිය.

වියළි කලාපීය ජනපද ව්‍යාපාරය සිංහලදෙමළ වාර්ගික සම්බන්ධතා කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළ ප්‍රධාන සංසිද්ධියකි. 1946 වර්ෂයේ දී උතුරු නැගෙනහිර පළාත් දෙකෙහි මුළු ජනගහනය 758,684 ක් විය. ඉන් 78.6% ද්‍රවිඩයන් වූ අතර 16.8% ක් මුස්ලිම් ද 4.4% ක් සිංහල ජනතාව ද විය. ජනපද ව්‍යාපාරය තුළ 1953 වන විට මෙම පළාත් දෙකේ ජනගහන පැහැදිළි වෙනසක් දැකිය නොහැක. සිංහල අනුපාතය 6.6% ක් ද මුස්ලිම් 17.5% ක් ද දක්වා වැඩි වන විට දෙමළ ප්‍රතිශතය 75.6% දක්වා අඩු විය (අයිවන්: 1983 45). මේ තත්වය 1980 දශකය වන විට ප්‍රබල වෙනසකට බඳුන් විය. සිංහල 13.3% ක් ද මුස්ලිම් 17.6% ක් ද දක්වා වැඩිවන විට දෙමළ 66.6% දක්වා අඩු විය (Nagaragan 1988:19).

යාපන දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයෙන් වගා කළ හැකි භූමි ප්‍රමාණය 30% ක් වන අතර 1948 වන විටත් ඔවුන් එය ප්‍රයෝජනයට ගෙන තිබුණි. එබැවින් අනෙක් වියලි කලාපීය ප්‍රදේශයන්ට වඩා යාපනයේ කෘෂිකර්මාන්තය සඳහා ඇති පීඩනය වැඩි විය. මෙහි ජන පීඩනය කොළඹ දිස්ත්‍රික්කයට පමණක් දෙවැනි විය (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව) මෙවැනි තත්වයක් තුළ වියලි කලාපීය ගොවි ජනපදකරණය යාපන වැසියන්ට වැදගත් තැනක් ලබා නොදෙන විට වියලි කලාපයට සංක්‍රමණය වූ සිංහල ජනතාව කෙරෙහි යාපන ජනතාව තුළ කලකිරීමක් ඇති විය. 1956 දී සිංහල රාජ්‍ය භාෂා පනත සමඟ රාජ්‍ය අංශය තුළ රැකියා අහිමි වන තරුණයන් කෘෂිකර්මාන්තයට නැඹුරු වන අතර මෙවන් තත්වයක් අභියස නැගෙනහිර සිංහල ගොවිජනපද පිහිටුවීම සිංහල ජනයා කෙරෙහි වෛරයක් ඇති වීම නොවැළැක්විය හැකි කරුණක් විය (අයිවන් 1983:4647).

ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ ගොවිජනපද ව්‍යාපාර හේතුවෙන් වාර්ගික අනුපාතයෙහි සැලකිය යුතු වෙනසක් සිදු විය. 1946 වර්ෂයේ සිංහල ජන ප්‍රතිශතය 20.7% ක් වන විට දෙමළ 40.1% ක් විය. එහෙත් 1981 ජන හා සංඛ්‍යාලේඛන වාර්තාවන්ට අනුව සිංහල 33.6% දක්වා

වර්ධනය වන විට දෙමළ ජනගහනය 33.8% දක්වා පහළ වැටීමක් සිදුවිය. මේ සඳහා 1950 දශකයේ නැගෙනහිර පළාතෙහි ක්‍රියාත්මක කළ ජනාවාසකරණ ක්‍රියාවලිය හේතු වූයේය.

*වගු අංකය : 1 ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ ජනවාර්ගික අනුපාතය, 2000*

| ජනවර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සිංහල | 103,853 | **29.29** |
| දෙමළ | 112,007 | **31.59** |
| මුස්ලිම් | 137,453 | **38.77** |
| වෙනත් | 1,240 | **0.35** |
| එකතුව | **354,553** | **100** |

*මූලාශ්‍ර : Statistical Hand Book of Trincomalee District 2000*

ඉහත වගුවට අනුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වර්ෂ 2000 වන විට බහුතර ජනවර්ගය මුස්ලිම් විය. එය 37.77% වූ අතර දෙමළ 31.59% සහ සිංහල 29.29% ක් ද විය.

මෙම සිංහල ගොවිජනපද ක්‍රියාවලිය සම්බන්ධව උතුරු නැගෙනහිර දමිළ ජනතාව රජයට තරයේ විරුද්ධත්වය ප්‍රකාශ කළහ. එබැවින් මේ සම්බන්ධව විවිධ පර්යේෂකයින්ගේ අවධානය යොමුව තිබුණි.

> "සාම්ප්‍රදායික නිජභූමිය යන උදෙහෝග පාඨයෙන් දෙමළ ජනයාගේ අභිප්‍රාය කුමක් වුවත්, සත්‍ය කරුණක් නම් එම ප්‍රදේශ පිළිබඳ දේශපාලන අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමෙන් ඔවුන් ආරක්ෂක ප්‍රදේශයක් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණි (තම්බයියා 1986).

දෙමළ වාර්ගිකයින් දේශපාලනික වශයෙන් අයිතිවාසිකම් ප්‍රකාශ කිරීම මගින් ජන වර්ගයක් වශයෙන් ආරක්ෂිත ප්‍රදේශයක් වෙන්කර ගැනීමට උත්සහ ගත් බව මහාචාර්ය තම්බයියා විසින් පෙන්වා දෙන ලදි. නමුත් සිංහල ජනපදකරණයෙන් ඔවුන් සුළුතරය බවට පත්වීම තුළ ජනවර්ගයක් වශයෙන් අනාරක්ෂිත වීමට ඔවුන් බිය වූ බවත් එබැවින් සිංහල දෙමළ ජනවාර්ගික සම්බන්ධතාවය පළුදු වීමටත් මේ තත්වය ඍජුව බලපා ඇති බව පැහැදිලි වේ.

ජනපද පිහිටුවීම සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශකරන අර්සරත්නම් (1986) දක්වනුයේ ,

> "උතුරුමැද හා නැගෙනහිර පළාත්වල ජනපද පිහිටුවා සිංහල ජනයා වැඩි වශයෙන් පදිංචිකරවීම එම ප්‍රදේශවල දෙමළ ජාතින් සුළු කොට්ඨාසයක් බවට පමුණුවාලීමට දරන දේශපාලන උපක්‍රමයක් ලෙස ද්‍රවිඩයන් සලකන බවත් එම නිසා ඔවුන් තම නිජ භූමිය ලෙස සලකනා උතුරු හා නැගෙනහිර පළාත් ආරක්ෂා කරගැනීමට නැගී සිටීම තුළින් ජාතිවාදී අරගලය උග්‍ර වී ඇති බවයි."

රජයේ ගොවිජනපද ව්‍යාපාරය හරහා සිංහල ජනතාව දමිළ නිජ භූමිය ආක්‍රමණය කළ බව දමිළ ජනතාව සිතන බව රොබට් කර්නි (1985) දක්වයි. මේ අනුව ජනවාර්ගික අර්බුදය සඳහා වර්ගවාදී දේශපාලනයට දමිළ ජනතාව ඇද දැමීම සඳහා ගොවිජනපද ව්‍යාපාරය ද බල පෑ ප්‍රධාන කරුණක් වූයේය.

ගොවිජනපදකරණය ජනවාර්ගික ගැටුමක් බවට පරිවර්තනය වනුයේ එම ක්‍රියාවලිය සිංහල බෞද්ධ ජාතිකත්ව ක්‍රියාවලියකට පරිවර්තනය වීමත් සමඟය. නැතහොත් සිංහල බෞද්ධ ආධිපත්‍යයක් ජනපදකරණය තුළ ප්‍රචලිතවීමත් සමඟය. මෙය දිගු කාලීනව සමස්ථයක් ලෙස වාස්තවික ජාතියකගේ අවශ්‍යතාවයක් බව පීබල්ස් (1990) පෙන්වා දුනි.

> ''පළාත් සහා සංවර්ධන ව්‍යාපෘති මඟින් සුළු වාර්ගිකයින්ට සිදු වූ අයුක්තිය සඳහා සහන ලබා දීමට අවස්ථාව පැවතුනි. උදාහරණ ජාතික ඉඩම් කොමිසම විසින් පලානය වූ උතුරු මැද පළාතෙහි යෝජිත ඇල මඟින් උතුරු පළාතට වාරි ජලය ලබා දීමට එමඟින් යෝජිත විය.''

එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවුනි. එය ක්‍රියාත්මක වූයේ නම් උතුරු මැද පළාතේ බෞද්ධ කෘෂිකාර්මික ගොවිජනපද හා අසල්වැසි දෙමළ ජනතාව සමඟ ආර්ථික හා සමාජීය සම්බන්ධතාවය සමගින් වාර්ගික ගැටුම වළක්වා ගැනීමට අවස්ථාව තිබුණි. එහෙත් රජය අර්ධ ශතවර්ෂයක් පමණ කාලයක් සිංහල බහුතරයකගේ යහපත උදෙසා ගොවිජනපද ව්‍යාපාර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදි. දෙමළ විරුද්ධවාදීන් නොසලකා හරින ලදි. ජයවර්ධන රජය මෙම තත්වය තුළ සිංහල ජාතිකත්වය සහ දෙමළ බෙදුම්වාදය සැලකිල්ලට ගෙන ප්‍රතිපත්ති සකස්කළ ද එය අසාර්ථක විය. අවසාන ප්‍රතිඵලය වූයේ දෙමළ බෙදුම්වාදී ගරිල්ලා සංවිධානය විසින් (LTTE) සිංහල බෞද්ධ ජනපදවාසීන් ඝාතනය කිරීමය (Peebles 1990).

ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් දෙමළ ජනයා බහුල ලෙස වාසය කරන ප්‍රදේශ වන අතර එම ප්‍රදේශ ඔවුන් තම "දෙමළ නිජභූමිය" (Tamil Homeland) ලෙස හඳුනා ගනියි. එහි විශාලත්වය සහ ප්‍රාරම්භක පදිංචිය පිළිබඳ 1951 අප්‍රේල් මස පවත්වන ලද ෆෙඩරල් පක්ෂ ප්‍රථම සංමන්ත්‍රණයේ දී සඳහන් කර ඇත. ෆෙඩරල් පක්ෂයේ සිව්වන සංවත්සර උත්සවයේ දී ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳ සඳහන් කර ඇත (මැදිවකෘ 1991 38).

> "1948 සිට ගොවි ජනපද පිහිටවීමේ ප්‍රතිපත්තිය අනුව ක්‍රමයෙන් අපේ නිජභූමි ප්‍රදේශවලට සිංහල ජනයා සංක්‍රමණය වෙමින් ද්‍රවිඩ ජාතීන් විනාශ කිරීමේ වැඩ පිළිවෙලක් අරඹා ඇත"

මෙම ජනපදකරණය තුළින් ද්‍රවිඩ ජනතාව ඔවුන්ට අසාධාරණයක් වීයැයි සඳහන් කිරීම පිළිබඳව අදහස් දක්වන කේ. එම්. ද සිල්වා (1973:214) පෙන්වා දෙන්නේ ජන සංගණනවලට අනුව 1971 ද්‍රවිඩ ජනතාවගෙන් 29.2% ද 1981 දී 32.8% ක් ද උතුරු නැගෙනහිර පළාත්වලින් බැහැරව ජීවත් වන බවයි. ගොවිජනපදකරණය දමිළ අයට අසාධාරණයක් වී නම් කන්ද උඩරට ඉන්දියානු දෙමළ ජනතාව පදිංචි වීම සිංහලයන් හට තර්ජනයක් බව පෙන්වා දෙයි. මේ හේතුවෙන් ජනපදකරණය ඓතිහාසික අවශ්‍යතාවයක් මිස ද්‍රවිඩ ජනතාවට කරන අභියෝගයක්

නොවන බව ද ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි. කෙසේ නමුත් ගොවිජනපදකරණය වාර්ගික විභේදනයට හේතුපාදක වූ ප්‍රධාන කාරකයක් බැව් පැහැදිලි වේ-

## සිංහල රාජ්‍ය භාෂා පනත

1956 සිංහල රාජ්‍ය භාෂා පනත සිංහල දෙමළ සම්බන්ධතාවය බිඳ වැටීම කෙරෙහි බලපෑ තවත් රාජ්‍ය ප්‍රතිපත්තියකි- බොහෝ විචාරකයෝ මෙම සංසිද්ධිය පැවති ජනවාර්ගික අර්බුදයට බලපෑ ආසන්නම හේතුව ලෙස හඳුන්වා දීමට උත්සුක වෙති. බහුතර ජනතාව නියෝජනය කරමින් සිංහල භාෂාව, රාජ්‍ය භාෂාව කිරීමෙන් සුළු ජනවර්ග සඳහා අසාධාරණයක් සිදුව තිබේ. එබැවින් ප්‍රධාන සුළු ජනවර්ගය වන දෙමළ ජනතාව ඒ සඳහා දැඩි විරෝධතාවයක් පළ කළහ. සිංහල භාෂාව, රාජ්‍ය භාෂාව කිරීම හේතුවෙන් ගාලු මුවදොර පිටියේ දෙමළ දේශපාලන නායකයන්ගේ ප්‍රධානත්වයෙන් දෙමළ ජනතාව විරෝධතා දැක්මක් ද සත්‍යග්‍රහණයක් ද පැවැත්විණ. එතැනට පැමිණි සිංහල පිරිස් ඔවුන්ට හිරිහැර පීඩා කළහ. ඉන්පසු තවදුරටත් ඔවුන් අතර සම්බන්ධතා බිඳ වැටුණු අතර රටේ කිහිප පළකම හිංසාකාරී ක්‍රියා ඉස්මතු විය (විමුක්ති ප්‍රකාශන 1983:23)- තරුණ දමිළ නායකයෙකු වූ වී. එන්. නවරත්නම් භාෂා පනත පිළිබඳ විවාදයට එක් වී මෙසේ ප්‍රකාශ කරන ලදී.

> "වැඩිකල් නොගොස් මේ ස්වාධීන දෙමළ රාජ්‍යය පිහිට වූ පසු (මා හිතනවා ෆෙඩරල් ක්‍රමයක් කියා) අපේ ස්වාධීන රාජ්‍ය පිහිට වීමට උදව් වූ අයගේ ස්මාරක හදන විට ඒ අය අතර ඉදිරියෙන් සිටීවි බණ්ඩාරනායක මහතාගේ නම. එවිට සිංහල අය දැන ගනීවි ඔවුන්ව පාවා දුන්නේ කවුද කියා"

මෙවැනි ප්‍රකාශනයකින් පැහැදිලි වන්නේ ජනවාර්ගික අර්බුදය ඇති වීම කෙරෙහි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කොතරම් බලපා ඇද්ද යන්නයි. භාෂා ප්‍රශ්නයේ දි සිංහල අන්තවාදීන්ගේ නමට නැමුණු පාලකයෝ දෙමළ කථා කරන ජනයාගේ ඉල්ලීම් පාගා දැමූහ. එයින් පාලකයන් කල්පනා කලේ බහුතර සිංහල ඡන්ද පිළිබඳ පමණි (ප්‍රනාන්දු 2000:10). මෙසේ තමන්ට නැති වූ අයිතිවාසිකම් ලබා ගැනීමට ඇති එකම මාර්ගය ෆෙඩරල් රාජ්‍යක් යැයි ප්‍රකාශ කිරීමට දෙමළ ජනයාගේ විඥාණය ගොඩ නැගීමට හේතු වී ඇත.

සිංහල භාෂා රාජ්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධව ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ප්‍රශ්නයක් නැගුවේය. **අපට අවශ්‍ය වන්නේ එක් භාෂාවක් සමඟ ජාතීන් දෙකක්ද ? නැත්නම් භාෂා දෙකක් සමඟ එක ජාතියක්ද ?** මෙයින් ඔහු අදහස් කළේ සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීමෙන් ප්‍රතිවිරුද්ධ සතුරු ජාතීන් දෙකක් බිහිවන බවත් භාෂා දෙකට සම අවස්ථාවන් ලබාදීමෙන් ජාතීන් අතර බෙදීම් වලක්වා ඒකීය ලාංකීය ජාතියක් ගොඩ නැගිය හැකි බවත්ය (උයන්ගොඩ 1990 :27).

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා භාෂාවේ වැදගත්කම දක්වා ඇත්තේ පහත අයුරිනි (හැන්සාඩ් 1956 :576).

"රටවැසි භාවයේ ඉතා වැදගත් අංශය භාෂාවයි. මක්නිසා ද භාෂාව ජාතියක පිවයයි. පැවැත්මයි. ජනතාවගේ අභිප්‍රායන්, අභිලාෂයන් සහ විශිෂ්ට ජයග්‍රහනයන් නිදන්කොට තබත්තේ, ආරක්ෂා කරන්නේ භාෂාවෙනි. මනෝවිද්‍යානුකූලව භාෂාව ජාතියකට වැදගත් වේ"

භාෂාව පිළිබඳ මෙවැනි විශ්ලේෂණ කර තිබුණ ද අගමැති ධූරයට පත් වූ පසු පක්ෂ දේශපාලන තරඟකාරීත්වය තුළ සුළු ජනවර්ග අයිතිවාසිකම් හිතාමතා පාගා දැමුබව දේශපාලන විචාරකයින්ගේ මතයයි.

යටත්විජිත යුගයේ පැවතියේ සිංහල දෙමළ තරඟකාරීත්වයකි. එහෙත් මෙම තරඟකාරීත්වය 1948 නිදහසින් පසු ගැටුමක් බවට පරිවර්ථනය විය. එහි ප්‍රථම අවස්ථාව ලෙස 1956 සිංහල භාෂා පනතට එරෙහිව දෙමළ ජනතාව ගාලු මුවදොර පිටියේ උද්ඝෝෂණ ව්‍යාපාරයක් සිදුකළහ. එතැනට පැමිණි සිංහල වර්ගවාදී ජනතාව ඔවුන්ට පහර දී එය ව්‍යවර්ථ කර දැමූහ. මේ හේතුවෙන් බොහෝ ප්‍රදේශවල සිංහල දෙමළ ගැටුම් ඇති විය (බාලසූරිය 1983:10).

මෙයින් පසු දෙමළ ජනතාව- දෙමළ භාෂාව රාජ්‍ය භාෂා තත්වයට ගෙන ඒමට, එනම් සිංහල භාෂාව සහ සම අයිතිවාසිකම් ලබා ගැනීමට ප්‍රබල ප්‍රයත්නයක් දරන ලදි. එහි ප්‍රතිඵලයන් ලෙසින් 1958 අංක 28 දරණ ද්‍රවිඩ භාෂා විශේෂ වරප්‍රසාද පනත නීතිගත විය. භාෂා ප්‍රශ්නය ජනවාර්ගික ගැටුම්වලට මූලික හේතුවක් වූ බව ප්‍රසිද්ධ ලේඛකයකු වූ ටාසි විට්ටච්චි ද පෙන්වා දෙයි (1957:57). 1957 දෙමළ ජනයා රටපුරා සත්‍යාග්‍රහ ව්‍යාපාර අරම්භ කරන ලදි. මොවුන් ප්‍රධාන උද්ඝෝෂණ සඳහා තෝරා ගත්තේ කොළඹ නගරයයි. ඒ සමස්ථ ජනතාවට දැනුම් දීමේ උපක්‍රමයක් වශයෙනි. එහෙත් ඒ සඳහා ද ඔවුන්ට අවකාශය නොලබෙනවිට ඔවුන්ගේ විරෝධතාවන් උතුරු පළාතට විතැන්වේ- කෙසේ වෙතත් මෙම ප්‍රතිපත්තිය හේතුවෙන් දෙමළ ජනතාව රාජ්‍ය කෙරෙහි විශ්වාසය නොතිබීමට හේතු වූවා පමණක් නොව සිංහල සහ දෙමළ ජනතාව අතර විශ්වාසය පළුදුවීමටත් බලපෑවේය-

## 1958 දී රථ වාහන ලියාපදිංචි කිරීමේ ප්‍රතිපත්තිය

1958 දී රථ වාහන ලියාපදිංචියට යොදා ගත් ඉංග්‍රීසි අකුරු වෙනුවට "ශ්‍රී" අක්ෂරය භාවිතය භාෂා පනතේම තවත් අංගයකි. මෙහි දී දෙමළ ජනතාව එයට විරුද්ධව ශ්‍රී අකුර දෙමළෙන් ලියා භාවිතා කළ සිද්ධීන් වාර්තා වී ඇත. තව ද මෙම හේතුව නිසා අලුත් වාහන මිලදී ගැනීමට අකැමැත්තක් දක්වා තිබේ. එහෙයින් අද්‍යතනයෙහි ද යාපනය තුළ ඉංග්‍රීසි අකුරෙන් ලියාපදිංචි කරන ලද වාහන වැඩි ප්‍රමාණයක් ඇති බව විචාරකයෝ පෙන්වා දෙති. සාමාන්‍ය සිංහල දෙමළ ජනතාව අතරත් මේ ශ්‍රී ප්‍රශ්නය නිසා ගැටුම් ඇති විනි. මෙම ගැටලුව සිංහල දෙමළ ජනතාව අතර සබඳතා බිඳ වැටීමට බලපා ඇත.

1958 වර්ෂයේ දී සිංහල දෙමළ ගැටුමක් ඇතිවන අතර මෙම ගැටුමෙන් 50,000 ක් පමණ දෙමළ ජනකායක් කළහකාරී පිරිස් විසින් හිංසා කර දකුණින් පන්නා ගන්නා ලදි. මෙම තත්වයෙන් පසු අනාරක්ෂිත බව හේතුවෙන් බොහෝ දෙනෙක් ලංකාව හැර ගියහ. මෙම තත්වය

යටතේ කොළඹ දී සිදු කරන අහිංසාකාරී උද්ඝෝෂණ ක්‍රියා මාර්ගයක් කෙරෙහි තව දුරටත් ගෞරවයක් සහ සාධාරණයක් බලාපොරොත්තු නොවිය හැකි බැවින් 1961 දී දමිළ නායකයෝ අහිංසාවාදී විරෝධපෑමක් යාපනයේ සංවිධානය කළහ. විකල්ප තැපැල් සේවාවක් ක්‍රියාත්මක කිරීම තුළින් ද රජයට විරෝධය පෑහ. රාජ්‍ය ආරක්ෂක හමුදාව එය ද ව්‍යර්ථ කරන ලදී (බාලසූරිය 1983:10).

## විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රමිතිකරණ ප්‍රතිපත්තිය

විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රමිතිකරණය සහ විරැකියාව දෙමළ ජනතාව තුළ වෙනම රාජ්‍යයක් සඳහා තිබූ නව නැඹුරුව වර්ධනය කළේය. මෙම ප්‍රමිතිකරණ අවස්ථා කීපයක දී සිදු කර ඇත.

1973 මාධ්‍ය පදනම් කර ගත් ප්‍රමිතිකරණය
1974 මාධ්‍ය පදනම් කර ගත් ප්‍රමිතිකරණය සමඟ දිස්ත්‍රික් සලාක ක්‍රමය
1775 මාධ්‍ය පදනම් කර ගත් ප්‍රමිතකිරණය සමඟ දිස්ත්‍රික් සලාක ක්‍රමය
1976/ 1977 පහත සඳහන් න්‍යාය මත පදනම් වූ ප්‍රවේශකරණය

(දළ ලකුණු මත පමණක් 70% ක් ද දිස්ත්‍රික් පදනම මත 30% ද මෙයින් 16% ක් නොදියුණු දිස්ත්‍රික් සඳහා ද වෙන් කෙරුණි).

1973 කරන ලද ප්‍රමිතිකරණ හේතුවෙන් 1971 72 අධ්‍යයන වර්ෂය සඳහා තේරී පත් දෙමළ ශිෂ්‍ය සංඛ්‍යාව 399 ක් වූ අතර 1973 දී එම සංඛ්‍යාව 347 දක්වා අඩු විය. ඉහත සඳහන් ප්‍රවේශ ක්‍රමවල බලපෑම පිළිබඳ කළ සමීක්ෂණවල නිගමන තුළින් වර්ගවාදී ව බලන කළ ඇඟිල්ල එල්ල වූයේ දෙමළ ජනතාවටම ය (ප්‍රනාන්දු 2000:10).

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ඉංග්‍රීසි අධ්‍යාපනය හොඳින් ද්‍රවිඩ ප්‍රදේශයන්හි ව්‍යාප්තව පැවතුනි- එම නිසාම විශේෂයෙන් යාපන දිස්ත්‍රික්කයෙහි ද්‍රවිඩ ජනතාව රාජ්‍ය අංශය මෙන්ම පුද්ගලික අංශයන්හි ද සේවාවන්හි නියැලුනාහ (Jayawardhana 1987:03). දිවයිනේ සෑම ප්‍රදේශයකටම සංක්‍රමණය වී සිංහලයන් හා ජීවත් වෙමින් රැකියාවල යෙදීමට අවස්ථාව ලැබුණි. මේ තත්වය විවිධ දේශපාලන හේතු නිසා මඟ හැරීයන බව අවබෝධ කර ගත් ද්‍රවිඩ තරුණ තරුණියන් වෙනම රාජ්‍යයක් ලබා ගැනීම තුළින් එම අක්‍රමිකතා වළක්වා ගත හැකි බව විශ්වාස කලහ.

1970 දශකයේ ආරම්භය තුළ දෙමළ ජනතාව සන්නද්ධ අරගලයක් ඔස්සේ වෙනම දෙමළ රාජ්‍යයක් ඇති කළ යුතු යැයි යන අදහස වෙනුවෙන් රොක් වූවන් අතර දෙමළ රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් හා ප්‍රමිතිකරණ නීති රීති තුළ විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට අවස්ථාව නොලැබූවන්ගෙන් කැපීපෙනෙන ලක්ෂණය විය. මෙය තීව්‍ර කිරීමට 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද බලපෑවේය (අයිවන් 1983:70). නමුත් ද්‍රවිඩ ජනතාව ඉතා කුපිත කළ සිංහල රාජ්‍ය භාෂා පනත හේතුවෙන් 1978 ව්‍යවස්ථා සංශෝධනයෙන් දෙමළ භාෂාව ද ජාතික භාෂාවක් ලෙස පිළිගනු ලැබුවේය. එහෙත් ෆෙඩරල් රාජ්‍යයක් උදෙසා පැවති පරමාර්ථයෙන් ද්‍රවිඩ ජනතාව ගලවා ගැනීමට එය ප්‍රමාණවත් නොවීය.

1970 දශකයට පෙර ද්‍රවිඩ ජනතාව ඔවුන් වෙනුවෙන් වූ අසාධාරණයට උද්ඝෝෂණ, සත්‍යාග්‍රහ සහ උපවාස සිදුකරන ලද්දේ කොළඹ නගරය තුළය. එහෙත් 70 දශකයෙන් පසු ඔවුන් ඒ සඳහා යාපන දිස්ත්‍රික්කය තෝරාගෙන ඇත. උදාහරණයක් ලෙස 1987 සැප්තැම්බර් 15 නල්ලූර් කන්දසාමි කෝවිල අසල තිලීපන් කළ මාරාන්තික උපවාසය දැක්විය හැකිය. (රඝුදේවන් 1995: 3032) කේන්ද්‍රයේ පැවැති උද්ඝෝෂණ පර්යන්තයට ද්‍රවායනය වීමට විවිධ සිංහල බෞද්ධ දේශපාලන ක්‍රියාකාරකම් හේතු වී තිබේ.

1970 දශකය වන විට සිංහල දෙමළ සම්බන්ධතාවයේ විශ්වාසය පළුදු වී තිබුණ අතර මේ තත්වය විසඳීම සඳහා මෙකල ද්‍රවිඩ ජනතාව සිංහලයින් සමඟ සහයෝගී ඒකාග්‍රතාවයකට ප්‍රවේශ විය. එහෙත් සිංහල ජනතා ව එම ප්‍රවේශ වීම ට සැලකිල්ලක් නොදක්වන බව විවිධ දේශපාලන ක්‍රියාකාරකම් තුළින් පැහැදිලි වේ. එස්. ජේ. වී. චෙල්වනායගම් ෆෙඩරල් රාජ්‍යක් වෙනුවෙන් මුල දී ක්‍රියා කළ ද ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුමට එළඹීම තුළින් පැහැදිලි වන්නේ කවර හෝ අයුරකින් තමන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගැනීමට දැරූ උත්සාහයක් බවයි. එහෙත් ගිවිසුම කඩ වීමෙන් ඔවුන් ෆෙඩරල් රාජ්‍යයක් වෙත යොමු කර ඇති බව පැහැදි( ).

1977 එක්සත් ජාතික පක්ෂය හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, 1980 පවත්වන ලද සංවර්ධන පළාත් ඡන්දය, 1981 දී යාපන පුස්තකාලය ගිනි තැබීම, ද්‍රවිඩ ජනතාව ප්‍රකෝප කිරීමට හේතු වූ බව විචාරකයන් පෙන්වා දෙයි. 1983 දී 06 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය ද්‍රවිඩ ජනතාව ස්වාධීන රාජ්‍යයක් කෙරෙහි තල්ලු කිරීමට ඉවහල් වී ඇත. ඒ තුළින් සියලු මන්ත්‍රීවරු ඒකීය රාජ්‍යක් වෙනුවෙන් දිවුරුම් දිය යුතු අතර ෆෙඩරල් රාජ්‍යයක් වෙනුවෙන් ඉදිරිපත් වූ ද්‍රවිඩ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව වර්ජනය කළහ. අනතුරුව ද්‍රවිඩ ජනතාවට පාර්ලිමේන්තු නියෝජනය අහිමි වන අතර මේ තත්ත්වය තත්කාලීන උතුරුනැගෙනහිර අර්බුදයට සෘජුවම බලපා ඇත.

1970 දසකයේ මැද භාගයේ දී තරුණ දෙමළ පිරිස් එකමුතු වන්නටත්, ආයුධවලින් සන්නද්ධ වන්නටත් පටන් ගත්හ. ඔවුහු යාපනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හිතවත් නගරාධිපති ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා ජාති ද්‍රෝහියෙක් ලෙස සලකා ඝාතනය කළහ. යාපනයේ ප්‍රථම දේශපාලන ඝාතනය එය විය. 1977 දී තොන්ඩමන්, එක්සත් ජාතික පක්ෂය සමඟ එක්වී රාජ්‍ය බලය ලබා ගත්තේය. එහෙත් ඔවුන්ට රාජ්‍ය බලය අහිමි වූ විට නැවත වතාවක් ෆෙඩරල් රාජ්‍යයක් ඉල්ලන්නට විය. එබැවින් 1977 දී යළිත් දෙමළ ජනතාවට විරුද්ධව හිංසාකාරී ක්‍රියා ඇති විය. මේ හේතුවෙන් දෙමළ තරුණයෝ 1978 දී විටින් විට හිංසාකාරී ක්‍රියා කළහ.

1983 ජුලි 23 ඇති වූ සිද්ධිය පැවති යුද්ධයෙහි මූලාරම්භය ලෙස අධ්‍යයනවේදීන් පෙන්වා දෙති. මෙදින යාපනයේ දී LTTE සංවිධානය විසින් යුද හමුදා ට්‍රක් රථයක් පුපුරවා හැරීමෙන් හමුදා සෙබලු 13ක් ජීවිතක්ෂයට පතකළේය. එබැවින් රට පුරා සිංහල දෙමළ ජනතාව අතර බිහිසුණු ගැටුම් හටගත්තේය. මෙය කෙතරම් බිහිසුණු ද යන්න සාමකාමී සහජීවනයෙන් සිටි මෙම වාර්ගික ජනතාව අතර මිනී මැරුම් 471 ක් ද තුවාල සිදු කිරීම් 3796 ක් ද ගිනි තැබීම් 8077 ක් ද මංකොල්ල කෑම් 3833 ක් ද නිල වශයෙන් වාර්තා වීමෙන් පැහැදිලි වෙයි (Dissanayake 1983 :93).

1983 වර්ෂයෙන් පසු දෙමළ ජනතාව ඔවුන්ගේ බලාපොරොත්තු සාධනය කර ගැනීම් වස් යුධ මගට යොමු විය. ඒ සඳහා LTTE සංවිධානය තම යුධ ශක්තිය තහවුරු කිරීම සඳහා යාපනයේ බැංකු ගණනාවක් කොල්ලකෑහ. කොල්ලකෑම් විනාශ කිරීම් කළ අය උසාවියට ඉදිරිපත් කළ අවස්ථාවක එම චූදිතයන් වෙනුවෙන් ඉදිරිපත් වූ එන්. සත්‍යේන්ද්‍රන් නම් නීතිඥවරයා මෙසේ ප්‍රකාශ කළේය(සැටර්ඩේ රිවිව් 1983 මාර්තු 05)-

"මගේ සේවා අපේක්ෂකයින් වන විත්තිකරුවන් ගැන මේ උසාවියේ දී ප්‍රසිද්ධියේ යමක් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එනම් තම ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් තමන් ලබා තිබෙන ඉතාම මාහැඟි වස්තුව එනම් තම ජීවිතය පූජා කිරීමට සූදානම් පුද්ගලයින් හමුවේ මගේ ජාතියට අයත් ඒ පුද්ගලයින් හමුවේ, මා ඉතා පහත් තැනැත්තෙක් සේ මට දැනෙයි."

මේ තුළින් පැහැදිලි වන්නේ LTTE සංවිධානයේ යුධ ආරම්භය ද්‍රවිඩ ජනතාව ඔවුන්ගේ විමුක්ති මාර්ගය ලෙස සැලකූ බවයි. මේ මානසිකත්වය තුළ සිංහල ජනතාව කෙරෙහි ඔවුන්ගේ වෛරය දැඩි ලෙස වර්ධනය වී තිබුණ බව පැහැලිදිය. විශේෂයෙන් මෙවැනි ප්‍රකාශන තුළින් පැහැදිලි වන්නේ නොදැනුවත්වම ජනතාව යුධ ප්‍රවේශයට ගැනීම දැනුවත් දේශපාලනයේ පරමාර්ථය බවයි.

1983 ජුලි 30 දින සැටර්ඩේ රිවිව් පත්‍රයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් "මේ තුච්ච පනත පහකරනු" මාතෘකාව යටතේ කතු වැකිය මෙසේ රචනා කර ඇත.

"මේ අන්දමේ ප්‍රථම නීතිය පනවන ලද්දේ නිදහස ලැබූ පළමු අවුරුද්දේදීම ය. එය නම් දෙමළ ජනයාගේ කොටසක් රටවැසි නමින් බැහැර කළ 1948 අංක 18 දරණ රටවැසි පනතයි. තවද 1943 අංක 03 දරණ ඉන්දියානු සහ පාකිස්ථාන පදිංචිකරුවන්ගේ පනත ද විශාල සංඛ්‍යාවක් දෙමළ ජනයාගේ ඡන්ද බලය අහිමි කළහ. 1949 අංක 48 දරණ ලංකා සංශෝධන පනත ද පනවන ලදි. ඉන්පසු පැමිණියේ මේ රටේ හැම දෙමළ වැසියෙක් ම කුමන ආචාර්ය උපාධිය ලබා තිබුණත් තම ජන්ම භූමිය තුළ නූගතෙක් බවට පත් කළ 1956 සිංහල පමණක් නීතියයි. දැන් අවුරුදු 03ට වැඩි කාලයක් තිස්සේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ද ක්‍රියාත්මකව ඇත. මෙතෙක් ආණ්ඩුව මුදුන් පමුණුවාගෙන ඇත්තේ කුමක්ද?"

ඉහත උපුටා දැක් වීමෙන් පැහැදිලි වන්නේ දෙමළ ජනතාවට ඔවුන් පවසන බහුතර සිංහල බෞද්ධ රාජ්‍ය තුළ ඔවුන්ට විඳින්නට සිදු වූ තත්වයයි. මෙහි විශේෂත්වය මෙකල "සැටර්ඩේ රිවිව්" පත්‍රයේ ප්‍රධාන කර්තෘ ගාමිණී නවරත්න නම් සිංහල පුද්ගලයෙක් වීමයි. ඔහු අපක්ෂපාතීව වර්ගවාදී නොවී මේ තත්වය විග්‍රහ කිරීමට උත්සාහ ගෙන ඇත. කෙසේ වෙතත් රාජ්‍ය විරෝධී නම ගත් ද්‍රවිඩ යුද්ධය 2009 මැයි මස වන විට විශාල දේපල හානියක් සහ වටිනා ජීවිත දහස් ගණනක් අහිමිකර අවසන් වූයේය-

නිදහස් ශ්‍රී ලංකාව තුළ සමාජ විකාශනය විමසුමට ලක් කිරීමේ දී පැහැදිලි වන්නේ සිංහලයන් බහුතරය වීම නිසාම මෙය සිංහල රට සේ පිළිගෙන සෙසු වර්ගයන්ගේ

අනන්‍යතාවයන් ඊට යටත් කිරීමට දැරූ උත්සාහය තුළ සිදුවූයේ ලාංකීය අනන්‍යතාවය යටපත් වී වෙන් වෙන් වූ සුවිශේෂී අනන්‍යතාවයන් රැක ගැනීම සඳහා වූ අරගලයක් තව තවත් ඉස්මත්තට පැමිණීමය (ප්‍රනාන්දු 2000:07). 1983 රට පුරා දෙමළ ජනයා වෙත එල්ල වූ මහා පරිමාණ ප්‍රහාරයන් හේතුවෙන් ලක්ෂ සංඛ්‍යාත දෙමළ ජනයා රට හැරයාමට පටන් ගත්හ. මේ තත්වය තුළ උදව් ලබාගත හැකි සියළුම ස්ථානවලින් උදව් ගනිමින් උතුරු නැගෙනහිර දෙමළ සන්නද්ධ අරගලයක් ගොඩ නැඟීම සිදු විය (ප්‍රනාන්දු 2000:10). කෙසේ වෙතත් මෙම බෙදුම්වාදි යුද්ධය 1983 ආරම්භ වූ අතර මෙය උතුරු සහ නැගෙනහිර පළාත් ප්‍රධානකොට ලංකාවේ සෑම ප්‍රදේශයක ම යුදමය ප්‍රචණ්ඩත්වය පැතිරීම ප්‍රශ්නයක් බවට පත්ව ඇත (Goodhand 200:10). මෙම නිසා ශ්‍රී ලංකාවේ ජනවාර්ගික යුද්ධය සෑම අංශයක් කෙරෙහිම සෘණාත්මක බලපෑමක් එල්ල කිරීමට සමත්ව ඇත.

නිදහස් ලංකාවේ විකලනය (Disintegration) වූ ජනවාර්ගික සමූහ තුළ බහුතර සිංහල ජනතාව ශ්‍රී ලංකා රාජ්‍යය තන්ත්‍රය සිංහල බෞද්ධ අධිපතිවාදී රාජ්‍යය තන්ත්‍රයක් වශයෙන් ගොඩ නැංවීය. බහුවාර්ගික සමාජයක, රටක ප්‍රධාන ජනතාවගේ වාර්ගික හා ආගමික අවශ්‍යතාවයන් නෛතික වශයෙන් ප්‍රමුඛත්වයට පත්කිරීම තුළ සුළු වාර්ගික කණ්ඩායම් දෙවැනි පුරවැසියන් බවට පත්වීම එමගින් සිදුවෙයි. එහි ප්‍රතිඵලය වන්නේ රාජ්‍යය ජාතිකත්වය බිඳවැටී වාර්ගික ස්වාධීනත්වය උදෙසා වූ සටන්කාමී දේශපාලන ව්‍යාපාර කරා ජනවර්ග අවතීර්ණය වීම නිරායාශයෙන් සිදුවන්නකි. ලංකාවේ ජනවාර්ගික අර්බුදය කෙරෙහි බලපාන ලද තත්වය ද මෙයයි.

කිසියම් රටක එක් ජනවර්ගයක් එම රටේ පාලනය අත්කරගෙන සිටින විට සුළු ජන වර්ගයන්ගේ ඕනෑ එපාකම් නොසලකා බහුතරයේ අවශ්‍යතාවන් නෛතික වශයෙන් ස්ථාපිත කිරීම බොහෝවිට සිදුවෙයි. මෙවැනි තත්වයක් ජනවාර්ගික අර්බුදයකට පදනම සපයයි. ලෝකයේ වත්මන් රාජ්‍යය සංකල්පය සාර්ථකත්වය සඳහා **ජාතික අනුකලනය (National integration)** වැදගත් වන්නේ එබැවිනි. බහුතරය පාලන කණ්ඩායමට පත්ව ඇති බැවින් සුළු ජන වර්ගයන්ගේ අයිතිවාසිකම් පැහැර හරිමින් ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සුළු ජනවර්ගයන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතාවයන් නොසලකා හැර ඇත. මෙම තත්වයන් නිසා සුළු ජනවර්ගයන් පීඩනයට ලක්වන අතරම එමනිසා ඔවුහු දේශපාලනීකරනයට ලක්වෙයි. දේශපාලනමය වශයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීමට උත්සාහ කරනු ලබයි. එය අසාර්ථක වන විට විකල්පයක් ලෙස ජනවාර්ගික අරගලයක් කරා ඔවුහු පිවිසෙති. බොහෝ බහුවාර්ගික රටවල තත්වය මෙය වෙයි. ශ්‍රී ලංකාවේ සමාජ විකාශන ක්‍රියාවලිය විමර්ශනය කිරීමෙන් පැහැදිළි වන්නේ ද එවන් තත්වයකි. නිදහස් ශ්‍රී ලංකාව තුළ සිංහල බෞද්ධ අධිපතිවාදය තුළ ජාතික අනුකලනය සිහිනයක් විය. පැවති ජනවාර්ගික අර්බුදය එහි සෘජු ප්‍රතිඵලයක් බව බොහෝ විචාරකයින්ගේ මතයයි. ශ්‍රී ලංකාව නිදහසින් පසු රාජ්‍ය පරිපාලනයේ දී ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සුළු ජනවර්ගයන්ගේ අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු වී නොමැති බව විචාරකයින්ගේ මතය වේ.